# හදිසි මරණ පරීක්ෂකවරුන් පිළිබඳ ස්ථාවර කාර්ය සංග්‍රහය

## 01. නීතිමය රාමුව.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීමේ බලය ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත පැවරෙන අතර එකී පනතේ XI හා XXX පරිච්ඡේදයන්හී සඳහන් විධිවිධාන අනුව හදිසි මරණ පරීක්ෂකවරුන් විසින් තම රාජකාරී කටයුතු සිදු කළ යුතුය.

## 02. පත්වීමේ ස්වභාවය.

I. හදිසි මරණ පරීක්ෂක තනතුර රජයේ වැටුප් ලබන තනතුරක් නොවන අතර ගරු තනතුරකි කෙසේ වුවද, හදිසි මරණ පරීක්ෂකවරුන් විසින් සිදු කරනු ලබන මරණ පරීක්ෂණ සඳහා ආයතන සංග්‍රාහයේ X වන පරිච්ඡේදයේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව ( අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 03/2019), අදාළ මහාධිකරණය හරහා ගෙවීම් සිදු කරනු ලැබේ.

II. හදිසි මරණ පරීක්ෂකවරුන්ට රජයේ වැටුප් ලබන වෙනත් කිසිදු තනතුරක සේවය කිරීමට නොහැකි අතර කාර්යාල වෙලාවන් හා රජයේ නිවාඩු දින නොසළකා හැකි සෑම අවස්ථාවකදීම තම සේවය ලබා දිය යුතුය.

III. හදිසි මරණ පරීක්ෂකවරුන් තම රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් කිසිදු බාහිර පාර්ශවයකින් කිසිදු ප්‍රතිලාභයක් හෝ මුදලක් ලබා ගැනීමේ හිමිකමක් නොමැත.

## 03. පත් කිරීමේ මූලික සුදුසුකම්.

### 1. හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශ සඳහා පත්කිරීම.

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

II. මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි අයෙකු වීම.

III. පත්වීම් අපේක්ෂා කරන හදිසි මරණ පරීක්ෂක බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසමක වසරක ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.

IV. වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩි විය යුතුය.

V. අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී එකවර විෂයන් 03 කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව හැර) සමත් වීම. ( ඉංග්‍රීසි භාෂා දැනුම, තාක්ෂණ දැනුම සහ අපොස උසස් පෙළ ජීව විද්‍යා විෂයන් 3 ක් සමත් වූ අයදුම් කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

VI. රාජකාරි ඉටුකිරිමට අපේක්ෂිත භාෂා මාධ්‍යයේ ප්‍රවිනයකු විම.

VII. උසාවිය ඉදිරියේ වරදකරුවකු නොවිම.

VIII. මීට පෙර ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ කිසියම් තනතුරකින් පහ නොකරනු ලැබූ අයකුවිම.

IX. 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කරන ලබන උපත් හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු වශයෙන් සේවයේ යෙදීම මෙම තනතුරට පත්වීමේදී නුසුදුසු කමක් ලෙස සලකනු ලැබේ.

## 2. රෝහල් සඳහා හදිසි මරණ පරීක්ෂකවරුන් පත්කිරීම

I. රෝහල් අයත් දිස්ත්‍රික්කයේ කොට්ඨාශයක හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් අවම වසර තුනක (03) අඛන්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
II. විනය පරීක්ෂණයකින් විමර්ශනයකින් වරද කරුවෙකු බවට පත් නොවූ අයෙකු විය යුතුය.
III. මනා ඉංග්‍රීසි දැනුමකින් හෙබි විය යුතුය.
IV. හදිසි මරණ පරීක්ෂක ඩිප්ලෝමාධාරියෙකු විය යුතුය.
V. අධිකරණ අමාත්‍යාංශය / සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුලු සඳහා සහභාගි වූ අයෙකු වීම.

## 3. තනතුරට පත්කිරීමේ ක්‍රමවේදය.

I. පුරප්පාඩු හදිසි මරණ පරීක්ෂක බල ප්‍රදේශයන් සඳහා ගැසට් පත්‍රයේ සහ අමාත්‍යාංශ වෙබ් අඩවියේ පලකරනු ලබන දැන්වීම මඟින් අයදුම්පත් කැඳවීම.

II. ඒ අනුව මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව ගරු අධිකරණ අමාත්‍යතුමාගේ අනුමැතිය මත පත්වීම් ලබා දෙනු ලැබේ.

## 4. වගකීම් හා කාර්ය භාරය.

I. අධිකරණ කටයුතු විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් සම්භාවනීය වුත්, ඉතාමත් වගකීමකින් යුක්ත වුත් හදිසි මරණ පරීක්ෂක තනතුරු සඳහා තැනැත්තන් පත්කරනු ලබන්නේ හදිසි මරණයක් සිදුවූ අවස්ථාවකදී ඒ පිළිබඳ කඩිනම් පරීක්ෂණයක් පවත්වා අධිකරණයට අධාර වීම මෙන්ම එහි හදිසි මරණයට භාජනය වන පුද්ගලයින්ගේ ඥාතීන්ට එම මෘත ශරීරය ඉක්මනින් භාරදීම හදිසි මරණ පරීක්ෂකවරුන් විසින් සිදු කරනු ඇතැයි යන විශ්වාසය පෙරදැරි කරගෙනය.

II. අනලස්ව, සාධාරණව සහ අපක්ෂපාතිව, තියුණු පරීක්ෂණයකින් යුක්තව මෙම නිර්දේශ අධිකරණය වෙත වාර්තා කිරීමට හදිසි මරණ පරීක්ෂකවරුන් නීතියෙන් බැඳී සිටී.

III. හදිසි මරණ පරීක්ෂකයෙකු වශයෙන් තොරතුරු වාර්තා කිරීම හා විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ඔබ තුළ ඊට අදාල නීති රීති පිළිබඳව පුළුල් අවබෝධයක් තිබිය යුතුය.

IV. සෑම හදිසි මරණ පරීක්ෂකයෙකුටම මෙම අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද වලංගු කාල සීමාව නොඉක්මවා පත්වීම් ලිපියක් හා නිල හැඳුනුම්පතක් තිබිය යුතුය.

V. සෑම හදිසි මරණ පරීක්ෂකයෙකුටම ලියාපදිංචි අනුක්‍රමික අංකයක් ලබා දෙන අතර , සිය රාජකාරි කටයුතුවලදී අනිවාර්යෙන්ම එම අංකය සඳහන් කළ යුතුය. සිය නිල මුද්‍රාවෙහිද එම අංකය ඇතුලත් කිරීම යෝග්‍යවේ.

VI. පත්වීම දී ඇති කාල සීමාව ඉක්මවීමෙන් පසුව රාජකාරි කටයුතු වල නිරත වීමෙන් වැලකී සිටිය යුතුය. සේවා දීර්ඝ කිරීමට අවශ්‍ය වේ නම් පත්වීම් කාල සීමාව ඉක්ම වීමට අවම වශයෙන් තුන් මසකට පෙර ලිඛිත ඉල්ලීමක් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

VII. හදිසි මරණ පරීක්ෂකවරුන් නීත්‍යානුකූල හේතු රහිතව මෘත ශරීර මරණකරුවන්ගේ ඥාතීන්ට භාරදීම ප්‍රමාද නොකළ යුතුය. විශේෂයෙන්ම ඉස්ලාමීය ආගමානුකූලව මුස්ලිම් අයෙකුගේ මෘත ශරීර පැය 24 ක් තුල භූමදානය කළ යුතු හෙයින් මුස්ලිම් ජාතිකයින්ගේ මරණ පරීක්ෂණ සම්බන්ධයෙන් ප්‍රමුඛතාවයකින් කටයුතු කළ යුතුය.

VIII. මරණ පරීක්ෂණයක් පවත්වන හදිසි මරණ පරීක්ෂකවරයාගේ කාර්යය අපරාධයක් හෝ වරදක් විභාග කිරීම නොවන අතර මරණයට හේතුව හා එය සිදු වූ අකාරය පිළිබඳව අධිකරණයට කරුණු වාර්තා කිරීම වේ.

IX. හදිසි මරණ පරීක්ෂණ කොට්ඨාශය තුල මරණයක් පිළිබඳව තොරතුරක් ලැබුණු වහාම මිය ගිය තැනැත්තාගේ සිරුර තිබෙන ස්ථානයට වහාම ගොස් පරීක්ෂණය පැවැත්වීම අත්‍යාවශ්‍යයා වේ. සිරුර වෙනත් ස්ථානයකට රැගෙන එන ලෙස ඥාතීන්ට දැන්වීම කිසිසේත්ම සිදු නොතළ යුතුය.

X. සෑම මරණ පරීක්ෂණයක් සම්බන්ධවම මෙයට අමුණා ඇති ආකෘතිය (ආකෘති පත්‍ර අංක 1) පිටපත් දෙකකින් යුක්තව පිළියෙල කර මරණ පරීක්ෂණ වාර්තාව සමඟ එක් පිට පතක් මහෙස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කිරීමද අනෙක් පිටපත හදිසි මරණ පරීක්ෂකවරයා වෙත ගොණුකර තබා ගැනීමටද කටයුතු කළ යුතුය. තබා ගනු ලබන ආකෘතියේ පිටපතක් ඉදිරිපත් කිරීමට හැකිවන සේ මෙම වාර්තා සුරක්ෂිතව තබා ගැනීම ඔවු සතු වගකීම වන අතර තනතුරෙන් ඉල්ලා අස්වීමක්, සේවය අවසන් වීමක් සිදුවන අවස්ථාවේදී එම තනතුරට පත් වන අනුප්‍රාප්තික හදිසි මරණ පරීක්ෂකවරයාට අදාල සියලු ලේඛනයන් ගොණුකර විධිමත්ව හා ලිඛිතව භාර දිය යුතුය.

XI. යම් මරණයක් සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු විසින් පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කල යුතුද යන්න තීරණය කිරීමේ වගකීම හදිසි මරණ පරීක්ෂකවරයා වෙත පැවරේ . අධිකරණයේ නඩුවකට යොමු විය හැකි සෑම සැක සහිත මරණයක්ම මෙන්ම රිය අනතුරක් නිසා සිදුවන මරණ මෙන්ම නිශ්චිත හේතුව සොයා ගැනීමට නොහැකි මරණ හා අමාත්‍යාංශ චක්‍රලේඛ මඟින් පෙන්වා දී ඇති අනිවාර්යෙන්ම පශ්චාත් පරීක්ෂණයක් සඳහා යොමු කළ යුතු මරණ අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කිරීම අනිවාර්ය වේ. අධිකරණ අමාත්‍යාංශය මඟින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක ඉහත ලේඛන ලබා දීමට හදිසි මරණ පරීක්ෂකවරයා බැඳී සිටී.

XII. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දෙන ලද B18 ආකෘතිය සෑම හදිසි මරණ පරීක්ෂණයක් සඳාහම භාවිතා කල යුතු අතර එහි මුල් පිටපත මරණය ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වෙත ලබා දීමට හැකි වන පරිදි ඥාතීන්ට භාර දිය යුතු අතර දෙවන පිටපත අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතුය.

XIII. රෝහලකට ඇතුලත් කිරීමෙන් පසුව හෝ රෝහල වෙත රැගෙන ඒමෙන් අනතුරුව තහවුරු කරන මරණ පිළිබඳව හදිසි මරණ පරීක්ෂණ එම රෝහලට පත් කොට ඇති හදිසි මරණ පරීක්ෂකවරයෙකු සිටී නම් ඔහු විසින්ද, එසේ නොමැති නම් එකී රෝහල අයත්වන බල ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක විසින්ද සිදුකල යුතුය.

XIV. යම් හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසයක් තුල යම් මරණයක් සිදුවී ඒ පිළිබඳව පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා රෝහලකට යොමු කරන්නේ නම් එම පරීක්ෂණය මරණය සිදුවූ ස්ථානයට අදාල හදිසි මරණ කොට්ඨාශයට අයත් හදිසි මරණ පරීක්ෂකවරයා විසින් හදිසි මරණ පරීක්ෂණය පැවැත්විය යුතුය.

XV. මාතෘ මරණ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2014 හා 13/2018 හි සඳහන් උපදෙස් අනුව කටයුතු කල යුතුය.

XVI. සෑම මරණ පරීක්ෂණයක් අවසන්කල වහාම අදාල වාර්තාව මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

XVII. මීට අමතරව අමාත්‍යාංශය විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, මාර්ගෝපදේශන හා උපදෙස්වලට අනුව රාජකාරි කටයුතුවල නිරතවිය යුතුය.

XVIII. යම් හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ සේවය අවසන් වුවහොත් එම කොට්ඨාශය සඳහා අලුතෙන් පත්වන හදිසි මරණ පරීක්ෂකවරයා වෙත තමා භාරයේ ඇති සියලු ලේඛන භාරදිය යුතුය. එසේම යම් හදිසි මරණ පරීක්ෂකවරයෙකු මියගිය හොත් එම කොට්ඨාශය සඳහා අලුතෙන් පත්වන මරණ පරීක්ෂකවරයා විසින් අදාල ලේඛන ලබා ගත යුතුය.

## 06. විනය පාලනය

I. හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ විනය බලධාරියා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර ඔහු විසින් ලබා දෙන උපදෙස් හා නියෝග අනුව රාජකාරි සිදු කල යුතුය. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝග පැහැර හැරීමක් සම්බන්ධව හෝ රාජකාරිය පැහැර හැරීමක් හෝ තනතුර අව භාවිතය සහ අයුතු යොදා ගැනීමක් සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශය වෙත ලැබෙන යම් පැමිණිල්ලක් හෝ තොරතුරක් ලද හොත් අධිකරණ අමාත්‍යාංශය ලේකම්වරයා මඟින් නම් කරනු ලබන රජයේ නිලධාරියෙකු මඟින් සිදු කරනු ලබන විමර්ශනයකින් අනතුරුව (විමර්ශනය මාස 03ක් ඇතුලත අවසන් කළ යුතුය) විනය පියවර ගනු ලැබේ. එම විමර්ශනයේදී එම චෝදනා සඳහා වැරදිකරු වුවහොත් ගරු අධිකරණ අමාත්‍යතුමාගේ එකඟතාව මත හදිසි මරණ පරීක්ෂක තනතුරෙන් ඉවත් කිරීම සිදුකරනු ලබයි.

## 07.සේවය අවසන් වීම

I. විනය හේතූන් මත, විමර්ශනයකට යටත්ව කරුණු දක්වා ඕනෑම මොහොතක හදිසි මරණ පරීක්ෂකවරයකුගේ සේවය අවසන් කිරීමේ බලය අධිකරණ අමාත්‍යතුමා සතු වේ.

II. යම් හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ වයස අවුරුදු 70 සම්පූර්ණ වීම

III. රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවක /කොමිෂන් සභාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක තනතුරකට පත් වුවහොත් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු වශයෙන් තේරී පත්වීම.

**08. හදිසි මරණ පරීක්ෂක බලප්‍රදේශ**

I. ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ සහ රෝහල් නියෝජනය වන පරිදි නිශ්චය කරනු ලබන තනතුරු ඇමුනුමෙහි දක්වා ඇත.

**09. සේවයට වාර්තා කිරීම.**

I. සියලුම හදිසි මරණ පරික්ෂකවරුන් තම බලප්‍රදේශයට අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්ථා කල යුතු අතර අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ විධිවිධානවලට යටත්ව රාජකාරී කටයුතු සිදු කල යුතුය.

ii. එසේම නියමිත අවස්ථාවේ සේවයට වර්තා කිරිමට අපහසු වන්නේ නම් ඒ සඳහා වැඩ බැලිමට එම කොට්ඨාශයේම හෝ ආසන්නතම කොට්ඨාශයේ හදිසි මරණ පරික්ෂකවරයා ඒ සඳහා නම් කිරිමට කටයුතු කල යුතුය.

**10. දේශිය හා විදේශ නිවාඩු.**

I. සතියේ දිනවලදී මෙන්ම රජයේ නිවාඩු දින හා සති අන්ත දිනවලද කාර්යාල වේලාවන් නොසළකා අවශ්‍යතාවය පරිදි සේවය සැපයීමට සියලුම හදිසි මරණ පරික්ෂකවරුන් බැදී සිටී. සති එකකට (01) වැඩි කාලයක් දේශීය හෝ විදේශ නිවාඩු ලබා ගැනීමට හදිසි මරණ පරීක්ෂකවරුන් අදහස් කරන්නේ නම් රාජකාරී ආවරණය සඳහා යාබද කොට්ඨාසයක හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ නමක් ද සහිතව අදාළ ඉල්ලීම අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතු වේ.

**11. මරණ පරීක්ෂණ සිදු කිරීම.**

I. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අනුව මාතෘ මරණ, සිය දිවි හානි කරගැනීමෙන් සිදු වූ මරණ, සතකු විසින් සිදු කරනු ලබන මරණ, යන්ත්‍රෝපකරණ නිසා සිදුවන මරණ අපරාධයක් නිසා සිදුවන මරණ, හදිසි අනතුරුවලට ලක්වූ මරණ, නිශ්චිත හේතුවක් නොදන්නා මරණ, නාදුනන මරණ හා විදේශිකයන් මිය යාමට අදාල මරණ සඳහා හදිසි මරණ පරීක්ෂණ සිදු කල යුතුය.

**12. අන්තර්කාල විධිවිධාන**

දැනටමත් ස්ථිර හා තාවකාලික පදනමින් සේවයේ නියුතු හදිසි මරණ පරීක්ෂකවරුන් හට නව ක්‍රමවේදය යටතේ බඳවා ගන්නා පලමු අවස්ථාවේදී අයදුම් පත් ඉදිරිපත් කිරීම සිදු කල යුතුය එහිදී ඔවුන්ගේ මනාපය, දැනට සිදුකරන සේවා පදනම (තාවකාලික / ස්ථිර) හා සේවා කාලය පදනම් කර ගනිමින් කොට්ඨාශ සඳහා අනුයුක්ත කරනු ලබයි.

රෝහල් සඳහා පත්කිරිමේදී සේවා පල පුරුද්ද හා හදිසි මරණ පරීක්ෂණ ඩිප්ලෝමා සාමාර්ථය ලබා තිබීම හෝ පුහුණුවක් ලබා ඇති හදිසි මරණ පරීක්ෂකවරුන් හට ප්‍රමුඛතාවය ලබාදීම.

**13. හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ නිල ඇඳුම.**

හදිසි මරණ පරීක්ෂණයකට සහභාගී වීමේදී තනතුරේ ගරුත්වය ආරක්ෂා වන පරිදි සුදුසු නිල ඇඳුමකින් සැරසී යාම බෙහෙවින් වැදගත්ය.

යුරෝපීය ඇඳුමෙන් සැරසී හදිසි මරණ පරීක්ෂණ කටයුතුවල නිරත වන හදිසි මරණ පරීක්ෂකවරුන් කළු පැහැති කලිසමක් සහ සුදු පැහැති කමිසයකින් සැරසී (ටයි පටියක් පැළඳීම) හෝ සුදු ජාතික ඇඳුමෙන් සැරසී රාජකාරියෙහි නිරතවීම යෝග්‍ය වේ.

කාන්තා හදිසි මරණ පරීක්ෂකවරින් සඳහා ඔසරිය / සාරිය අවස්ථානුකූලව සුදුසු ඇඳුමකින් සැරසී රාජකාරියේ නිරතවීම යෝග්‍ය වේ.